# චතාරික සමයේ තුන්වන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

හොසියා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

හොසියා 14: 1-9

**කිසි කලෙක අතින් තැනූ දේව රූප අමතා 'ඔබ අපේ දෙවියෝ' යයි නොකියමු.**

ඉශ්‍රායෙල් ජනයෙනි, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ වෙත හැරී එන්න. ඔබේ අයුතුකම් නිසා ඔබ වැටී සිටින්නහු ය. සමිඳාණන් වහන්සේ වෙත හැරී අවුත් මේ යාච්ඥාව උන් වහන්සේට ඔප්පු කරන්න. "අපේ සියලු අපරාධ වලට කමා වී අපේ යාච්ඥා කරුණාවෙන් පිළිගත මැනව. එවිට අපි පොරොන්දු වූ පරිදි ඔබට ප්‍රශංසා කරන්නෙමු. අප ගළවන්නට අසිරියාවට නොහැකිය. යුද්ධ රථ වාහනවලට අප ආරක්ෂා කළ නොහැකිය. මින්පසු කිසි කලෙක අතින් තැබූ දේව රූප අමතා 'ඔබ අපේ දෙවියෝ ය'යි නොකියමු. ස්වාමිනී, අනාථ අයට ඔබ වහන්සේ දයානුකම්පාව දක්වන සේක. මම ඔවුන්ගේ අපක්ෂපාතකම සුව කරමි. මාගේ මුළු සිතින් ඔවුන්ට ප්‍රේම කරමි. මන්ද ඔවුන් කෙරේ මාගේ උදහස පහ වී ගොස් ඇත.

ඉශ්‍රායෙල්ට මම පිනි මෙන් වන්නෙමි. ඔවුන් මානෙල් මෙන් පිපෙනු ඇත. ලෙබනොන්හි ගස් මෙන් මුල් අදිනු ඇත. ඔවුන්ගේ අතු විහිදී යයි. ඔලීව ගස් මෙන් හොබනේ වෙයි. ලෙබනොන්හි මෙන් සුවඳ පතුරයි. ඔවුන්

යළිත් ආපසු පැමිණ මාගේ සෙවණෙහි වසනු ඇත. උයනක් සේ සමෘද්ධ වී මිදිවැලක් සේ පල දරනු ඇත. ලෙබනොන්හි මිදියුෂ මෙන් කීර්තිමත් වනු ඇත. ඒප්‍රායිම් සෙනගට දේව රූපවලින් තවත් වැඩක් ඇද්ද? නුඹලාට පිළිතුරු දී නුඹලා ආරක්‍ෂා කරන්නේ මම ය. මම කිසි කලෙක නොමැලවෙන දේවදාර ගසකි. නුඹලාගේ රැකවරණය මම ය. නුඹලාගේ සියලු ආසිරිවලට උල්පත මම ය.”

මෙහි ලියා ඇති දේ ප්‍රඥාවන්තයෝ තේරුම් ගනිත්වා! බුද්ධිමත්තු දැන ගනිත්වා! සමිඳාණන් වහන්සේගේ මාර්ගය සෘජු ය. ධර්මිෂ්ඨයෝ ඒ මාර්ගයෙහි ගමන් කරති. එහෙත් පව්කාරයෝ එහි පැකිළ වැටෙති.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 81: 5b-7, 8-11, 13, 16

පිළිතුරු: සමිඳුනි, ඔබ අපගේ සමිඳාණෝ ය. අපි ඔබට සවන් දෙමු.

ගීය:

නුපුරුදු හඬක් මෙසේ කියනු මම ඇසුවෙමි. “මම ඔබේ කරෙන් බර ඉවත් කළෙමි. ඔබේ අත් දෙක කූඩා ඇදීමෙන් නිදහස් කළෙමි. විපතේ දී ඔබ අඬ ගැසුවහු ය. මම ඔබ නිදහස් කළෙමි.
මම අහස් ගිගුරුමේ සිට ඔබට පිළිතුරු දුන්නෙමි. මෙරිබා දිය උල්පත ළඟ දී මම ඔබ සෝදිසි කළෙමි.

අහෝ මාගේ සෙනගෙනි! මා ඔබට විරුද්ධව අනතුරු අඟවන විට මට සවන් දෙන්න. අහෝ ඉශ්රායෙල්වරුනි! ඔබ මට සවන් දෙන්නහු නම් කොපමණ යහපත් ද? ඔබ අතර බොරු දෙවි දේවතාවන් නොසිටිය යුතුය. විදේශීය දෙවි දේවතාවන් හට නමස්කාර නොකළ යුතුය.

මිසරයෙන් ඔබ මුදා ඔබ පිටතට ගෙනා දෙවි සමිඳාණෝ මම වන්නෙමි. ඔබේ මුව හොඳින් විවර කරන්න. එවිට මම ඔබ පෝෂණය කරන්නෙමි. එහෙත් මාගේ සෙනග මාගේ හඬට සවන් නුදුන්නෝ ය. ඉශ්රායෙල්වරු මට කීකරු නොවූහ.

මාගේ සෙනග මට සවන් දෙන්නෝ නම් ඉශ්රායෙල්වරු මා අනුව එන්නෝ නම් කොතරම් යහපත් ද?
එතුමාණෝ ඉස්තරම් ධාන්‍යයෙන් ඔබ පෝෂණය කරන සේක. වන මී පැණියෙන් මම ඔබ සෑහීමට පත් කරන්නෙමි.

## සාධුකාරය

"මනස්ථාපනය වන්න. ස්වර්ග රාජයය ආසන්න ය."

## සුවිශේෂය

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මාක් 12: 28 – 34

***“ඔබේ මුළු හෘදයෙන් ද, මුළු සිතින් ද, මුළු බුද්ධියෙන් ද, මුළු වීර්යයෙන් ද දෙවියන් වහන්සේට ප්‍රේම කරන්න.”***

විනයධරයන්ගෙන් කෙනෙක් පැමිණ, සද්දුසිවරුන් එකතු වී ජේසුස් වහන්සේ සමග විවාද කරනු අසා උන් වහන්සේ ඔවුන්ට මැනවින් පිළිතුරු දුන් බව ද දැක “සියලු ආඥා අතරෙන් ශ්‍රේෂ්ඨතම ආඥාව කිමෙක්දැ”යි උන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය. ජේසුස් වහන්සේ උත්තර දෙමින් “ශ්‍රේෂ්ඨතම ආඥාව මේය. ඉශ්රායෙල් වැසියෙනි, අසන්න. අපේ ස්වාමින් වන දෙවියන් වහන්සේ එකම ස්වාමින් වහන්සේ ය. නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ දෙවි ස්වාමින් වහන්සේ ප්‍රේම කරන්න.” දෙවැන්න මේ ය. ‘නුඹ නුඹට ම ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න.’ මෙයට වඩා ශ්‍රේෂ්ඨ අන් කිසි ආඥාවක් නැතැ” යි වදාළ සේක. එවිට විනයධරයා උන් වහන්සේට පිළිතුරු දෙමින්, “ගුරු දේවයිනි, එය සැබෑය. උන් වහන්සේ එම තැනැන් වහන්සේ ය”යි ඔබ කීවා හරි ය. උන් වහන්සේ හැර අන් දෙවි කෙනෙක් නැත. මුළු හෘදයෙන් ද මුළු සිතින් ද මුළු බුද්ධියෙන් ද මුළු වීර්යයෙන් ද උන් වහන්සේට ප්‍රේම කිරීම සහ තමාට මෙන්ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම, දවන යාග පූජා හා වෙනත් පූජා සියල්ලට ම වඩා ශ්‍රේෂ්ඨ ය”යි කීවේය. ඔහු කෙතරම් තේරුම් පැහැදුම් ඇතිව පිළිතුරු දුන්නේ දැයි

ජේසුස් වහන්සේ දැක “ඔබ දෙවියන් වහන්සේගේ රාජ්‍යයට නුදුරුව සිටින්නෙහි ය”යි ඔහුට වදාළ සේක. ඉන්පසු උන් වහන්සේගෙන් කිසි ප්‍රශ්නයක් අසන්න කිසිවෙකුට ධෛර්යයක් නොවීය.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**